# මාධ්‍ය සංස්කෘතිය සහ සමාජ ප්‍රගමනයෙහි ලා එහි ඥාතීත්වය

ආචාර්ය සේන නානායක්කාර

## හැඳින්වීම හා අරමුණ

21 වන සියවස වනවිට ලෝකය විවිධ විචල්‍යතාවලට බඳුන්වෙමින් පවති යි. සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික වශයෙන් ඒවා විවිධ ස්වරූප ගනියි. විද්‍යාව සහ තාක්ෂණය පදනම් කොටගත් ක්‍රියාවලීන් කරණකොටගෙන සමස්ත සමාජය තුළ ඊට අනුගත සංකීර්ණතා නිර්මාණයවීම වළකාලිය නොහැක. මෙම අධ්‍යයනයෙන් සාකච්ඡාවට බඳුන්කෙරෙන මාධ්‍ය සංස්කෘතිය (Media Culture) ද එබන්දකි. භාෂාත්මක, ව්‍යුහාත්මක විශ්ලේෂණයක දී එය හුදෙක් වචන යුගලයක් සහිත සරල නාමකරණයක් වුව ද, ස්වභාවිකත්ව විශ්ලේෂණයක දී වඩාත් ගැඹුරු, එමෙන් ම සංකීර්ණ අර්ථ සම්පාදනය කරන්නකි.

විවිධ විෂයානුකූල දෘෂ්ටිකෝණයන් තුළ පුළුල් අරුත් දනවන මේ කෙරෙහි සමාජීය විද්‍යාත්මක ප්‍රවේශයක් (Sociological Approach) හෙළිදරව් කිරීමත්, ලෝකය මේ වන විට වඩාත් අවධානය යොමුකරමින් පවත්නා සමාජ ප්‍රගමනයෙහි ලා දක්වන ඥාතීත්වය විමසා බැලීමත් මෙම අධ්‍යයනයෙහි ප්‍රමුඛතම අරමුණ ලෙස ගැනේ. ''සංවර්ධනය'' වූකලී අද්‍යතනයේ ලෝක ජනසම්භාවනාවට ලක්වෙමින් පවත්නා අතිශය වැදගත්ම සමාජ විචල්‍යතාව වන බැවින් ද ''මාධ්‍ය සංස්කෘතිය'' යනු නූතන මානව සංහතිය තුළ විද්‍යමාන අතිශය සක්‍රියතම සමාජ ප්‍රවණතාව වන බැවින් ද මෙකී අරමුණ කාලානුරූපව වඩාත් වැදගත් වනු ඇත.

## ගැටලුව

පූර්වෝක්ත හැඳින්වීම සහ අරමුණ මඟින් කුළුගන්වන ප්‍රශ්නකාරී ස්වරූපයන් කිහිපයකි. ජනමාධ්‍ය සංස්කෘතිය යනු කුමක් ද? එහි ව්‍යුහාත්මක ස්වරූපය කෙබඳු ද? එහි උපරිව්‍යුහය සහ අභ්‍යන්තරය විසින් හෙළිදරව් කරනු ලබන අනන්‍යතා කවරේ ද? එමෙන්ම, නූතන සමාජ ප්‍රවර්ධන ක්‍රියාවලියෙහි ලා එහි ඥාතීත්වය කවරාකාර ද? යන්න මෙහිලා උපස්ථම්භක පසුබිම් ක්ෂේත්‍රයන් ලෙස විවරණය කෙරේ. සමස්තයක් ලෙස ගත් කල මාධ්‍ය සංස්කෘතිය සහ සමාජ ප්‍රවර්ධනය යන පාර්ශවද්වයයෙහි ව්‍යවහාරික ඥාතීත්වය මෙහි කේන්ද්‍රීය ගැටලුව ලෙස ඉදිරිපත් කෙරේ.

## ක්‍රමවේදය

නූතන සමාජ විද්‍යාත්මක දෘෂ්ටි ප්‍රතිෂ්ටාවක් සහිත විශ්ලේෂණයක මූලික ගවේෂණ ක්‍රියාවලිය විය යුත්තේ මානව සම්බන්ධතා පිළිබඳ විමංසනය යි. එය අතීත, වර්තමාන හා අනාගත යන කාලත්‍රයට සාපේක්ෂව කෙරෙන විද්‍යාත්මක විවරණයකි. සිතුම්පැතුම්, අරමුණු, පරමාර්ථ, විශ්වාස, ඇදහිලි, සිරිත්විරිත් ඇතුළත් සකලවිධ චර්යාධර්මයන් ද සහිත අදාළ මානව සමාජ ක්‍රියාවලිය (Human Social Process) එහිදී අප අවධානයට යොමු කෙරේ. ඒ සඳහා උපස්ථම්භක කොටගත හැකි වැදගත්ම සාක්ෂි සටහන මුද්‍රිතව හෝ අමුද්‍රිතව ගොඩනැගී ඇති සාහිත්‍යය යි. එබැවින්, අදාළ සාහිත්‍යමය පරිශීලනය මෙම අධ්‍යයනයෙහි ප්‍රමුඛතම දත්ත ගවේෂණ ක්‍රමවේදය ලෙස නම් කෙරේ.

## විමර්ශනය

ශතවර්ෂ ගණනාවක ඇවෑමෙන් පෘථිවි ගෝලය තුළ සිදුවෙමින් පවත්නා බොහෝ දේ, එතෙක් ගත වූ කාලය තුළ සිදු වූ දෙයින් සපුරා වෙනස් බව පෙනේ. වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ප්‍රබල සමාජ කම්පනයක් ලෙස ගිනිය හැකි විද්‍යාව සහ තාක්ෂණය පදනම් කොටගත් අතිශය සංකීර්ණ විචල්‍යතාවන් ලෙස ඒවා නම් කෙරේ. අධ්‍යාපනය එහි දී ප්‍රමුඛ ව සම්භාවනයට ලක්වන්නකි. හුදු මිනිසා ගැන හෝ මිනිස් සමාජය ගැන සරලව කතා කරනු වෙනුවට සමස්ත මානව සමාජයක් (Human Society)

දක්වා එය පුළුල් වනුයේ එබැවිනි. වඩාත් විද්‍යාත්මක ව විමංසනය කළ හැකි මානවවේදයක් (Anthropology) සහ කාලත්‍රය විනිවිද දැකිය හැකි ශාස්ත්‍රීය ගැඹුරක් සහිත මානවවංශවිද්‍යාවක් (Ethnology) බිහිවන්නේ ද ඒ අනුව ය. එපමණක් නොව, මානවවංශ පුරාවිද්‍යාව (Ethno Archaeology), මානවවංශ ජීවවිද්‍යාව (Ethno Biology), මානවවංශ සත්ත්වවිද්‍යාව (Ethno Zoology), මානවවංශ උද්භිදවිද්‍යාව (Ethno Botany) සහ මානවවංශ මනෝවිද්‍යාව (Ethno Psychology) ඇතුළු තවත් බොහෝ ආනුෂාංගික විෂය ප්‍රවේශ නිර්මාණය කෙරෙනුයේ ද ඊට අදාළ ව ය.

මෙකී අධ්‍යයනයෙහි ලා කේන්ද්‍රීය සංකල්ප ද්විත්වයක් ලෙස ගැනෙන ''මාධ්‍ය සංස්කෘතිය'' හා ''සමාජ ප්‍රවර්ධනය'' ද ඒ අයුරින් නිෂ්පන්න විෂය පරිශ්‍රයන් ලෙස හඳුන්වා දිය හැකි ය. මානව සමාජය වූ කලී සමාජ සම්බන්ධතා ජාලයකි. එය නිබඳ වෙනස් වෙමින් පවතියි. එබඳු බැඳීම් සහිත ගතිකත්වයෙන් යුතු සමාජයක ගලායාම අතරතුර තිරසාර ව්‍යුහාත්මක ස්වරූපයක් හෝ තිරසාර ඒකමිතික පැවැත්මක් අපේක්ෂා කළ නොහැකි යැයි කීම සාවද්‍ය නොවේ. යට කී සංස්කෘතිය හා සංවර්ධනය යනු එයම විය නොහැකි ද? යන්න මෙහිදී පැන නගින ගැටලුවයි.

මාධ්‍ය සංස්කෘතිය විවරණය කිරීමේ ප්‍රවේශයක් ලෙස සංස්කෘතිය විමසා බැලිය යුතු ය. මන්දයත්, මාධ්‍ය සංස්කෘතිය කෙරෙහි ලා පසුබිම් ක්ෂේත්‍රය වනුයේ සමාජ සංස්කෘතිය වන බැවිනි. ඒ අනුව, සංස්කෘතිය යනු කුමක්දැයි බොහෝ විද්වත්හු අර්ථ දක්වති. ඉන් වියුක්ත මානව ක්‍රියාවලියක් හෝ සමාජ පැවැත්මක් පිළිබඳ සාකච්ඡා කළ නොහැකි තරමට ම එය මානවයා හා බැඳී පවතින බව පෙනේ. "දැනුම, විශ්වාස, කලා, සදාචාර, නීති, සිරිත්විරිත්, පුරුදු හා හැකියාවන් ඇතුළත් සංකීර්ණ සමස්තය" සංස්කෘතිය බව ඊ. බී. ටයිලර්ගේ (Edward Burnett Tylor, 1832-1917) ප්‍රකට මතයකි (Tylor 1924:1). සන්නිවේදනය ඇතුළත් සකලවිධ ක්‍රියාකාරකම් සඳහා අදාළ කොට ගත හැකි භාෂාව, තාක්ෂණය, මෙවලම් පරිහරණය, චින්තනය හා සියලු සංවේදනයන් ද එහිලා සපුරා ඇතුළත් වන බව එඩ්වඩ් බර්නට් ටයිලර් ස්වකීය ශාස්ත්‍රීය හෙළිදරව්වෙහි ප්‍රමුඛ කොට දක්වයි.

ඉන් දසක තුනකට අනතුරුව, සංස්කෘතිය සිය ශාස්ත්‍රීය ගවේෂණයෙහි ලා කේන්ද්‍ර කොටගත් රැල්ෆ් ලින්ටන් (Ralph Linton, 1893-1953) විසින් එය සමුදයාර්ථයෙහි ලා (for total meaning) ලක්කරනු ලැබීය. කිසියම් සමාජයකට විශේෂ වන්නා වූ ත්, එහි ගතිලක්ෂණ හැටියට සැලකිය හැක්කාවූ ත් දැන උගත් ප්‍රතිචාරයන් හි සංවිධානාත්මක එකතුවක් ලෙස එහි දී සංස්කෘතිය විග්‍රහ කෙරිණි (Linton 1957:29).

ටයිලර් විසින් හුවාදක්වනු ලැබූ පූර්වෝක්ත අදහස් දැක්වීමට වඩා, බෙහෙවින් පුළුල්වූ ත්, වඩාත් පරිණත විනිවිදභාවයක් සහිත අර්ථවිග්‍රහයක් ලෙස ලින්ටන්ගේ මතය සලකා බැලිය හැකි ය. නමුත්, නූතන සමාජවිද්‍යා අධ්‍යයනයන් තුළ ඒ කෙරෙහි ඉදිරිපත් කෙරෙන්නා වූ අර්ථසම්පන්න අංග සූත්‍ර වඩාත් විශ්වාසනීය වෙයි. එහිදී සංස්කෘතිය හැඳින්වෙනුයේ "ප්‍රතිමානික හැසිරීම් රටා ලෙස යි" (පල්ලියගුරු, 1990: 24). හුදෙක් පටු ලෙස ගැනෙන චර්යාව වෙනුවට, චින්තනය, විනෝදය, රුචිය, වින්දනය, කතාබහ, ඇඳුම්පැළඳුම්, කෑම්බීම්, සිරිත්විරිත්, විශ්වාස, ඇදහිලි, අරමුණු, පරමාර්ථ ඇතුළත් සකලවිධ සමස්තය පදනම් කොටගත් සමාජ ක්‍රියාකලාපය එතුළ අවධාරණය කෙරේ. එය ධර්මතාවක් (Norm) යැයි ද සිතිය හැකි ය. මැලිනොව්ස්කි (Bronislaw Malinski, 1884-1942) රේමන්ඩ් ෆර්ත් (Raymond Firth, 1901-2002), සහ මාග්‍රට් මීඩ් (Margaret Mead, 1901-1978) ආදී ඒ පිළිබඳ කළ පර්යේෂණාත්මක අධ්‍යයනයන්ගෙන් හෙළිදරව් වූ පොදු කරුණු කිහිපයකි.

සංස්කෘතිය වූ කලී දීර්ඝ කාලයක් පුරා පනපෙවුණු අඛණ්ඩ ක්‍රියාවලියක් ය යන්න එහි පළමුවැන්න යි. දෙවැන්න, එය වඩාත් පුළුල්, ගැඹුරු සහ ඓතිහාසික ඉගෙනුම් ක්‍රියාවලියක් බවයි. ඊළඟට සංස්කෘතිය යනු විවිධ සමාජ සම්බන්ධතා රාශියකින් යුතු ව්‍යුහාත්මක වශයෙන් අවිධිමත් සංකීර්ණ ජාලයක් ලෙස ත්, අවසන් වශයෙන් එය සමාජ අන්තර්ක්‍රියා සමුදායක අවසන් ප්‍රතිඵලයක් ලෙස ත් හැඳින්වෙයි. ඒ අනුව, සංස්කෘතිය පිළිබඳ ගවේෂණාත්මක හැදෑරීම්වලින් කුළුගැන්වෙන ව්‍යුහාත්මක ප්‍රමුඛ ලක්ෂණ සිව්වැදෑරුම් ය.

1. දීර්ඝකාලීන අඛණ්ඩත්වය (Continuity of long period of time)
2. ඓතිහාසික ඉගෙනුම් ක්‍රියාවලිය (Historical learning act)
3. පුළුල් සමාජ සම්බන්ධතා ජාලය (Wide social relationship network)
4. සමාජ අන්තර්ක්‍රියා හරය ( Core of social interactions)

එසේනම්, මෙම අධ්‍යයනයෙහි ලා ප්‍රස්තුත මාධ්‍ය සංස්කෘතිය සහ සමාජ සංවර්ධනය විග්‍රහය පිණිස ගොඩනැගෙන විෂයයික පසුබිම වඩාත් අර්ථසම්පන්න වෙයි. එමෙන් ම, එය අප පරමාර්ථ සාධනයෙහි ලා වඩාත් සමීප ය. මන්දයත්, මාධ්‍ය සංස්කෘතිය හෝ සමාජ සංවර්ධනය වූ කලී පූර්වෝක්ත සිව්වැදෑරුම් ලක්ෂණවලින් වියුක්ත කළ නොහැකි බැවිනි. එය යම්තාක් දුරට හෝ විස්තරාත්මකව විවරණය කිරීම මෙම අධ්‍යයනයෙහි ලා ඵලදායක වනු ඇත.

හෝමෝ සේපියන්ස් (Homo Sapiens) නම් මානවයා ලොව පහළ වූ කල සිට නූතනය දක්වා වූ දීගුකාලීන අඛණ්ඩත්වය තුළ විද්‍යමාන ප්‍රබලතම විපර්යාසය ජනමාධ්‍යය හා බැඳී පවතින බව ප්‍රකට සත්‍යය කි. ස්වකීය දෛනික ජීවනෝපාය පිණිස සතුන් දඩයම් කරමින් සිට, පසුකාලීනව ශිෂ්ටාචාරවත් වූ මිනිසා සිය සන්නිවේදන කාර්යයෙහි දී කාලය හා අවකාශය ජයගත්තේ හුදු ආංගික සන්නිවේදනය අතික්‍රමණය කළ භාෂණය, ලේඛනය, මුද්‍රණය ආදී ප්‍රගමනකාරී පියවර තබමිනි. එයින් නොනැවතී සිනමාව, ගුවන්විදුලිය, රූපවාහිනිය හා චන්ද්‍රිකා පණිවුඩ හුවමාරුව මඟින් මානවයා සිය ජීවිතය විද්‍යුත් ක්‍රියාවලියක් බවට පරිවර්තනය කොටගෙන ඇත. මේ වන විට එය සමස්ත මානව වර්ගයා හා බැඳී පවතින සංස්කෘතියක් බවට පත්වී ඇතැයි කීම අතිශයෝක්තියක් නොවේ. මෙය දීර්ඝ කාලීන අඛණ්ඩත්වයක සමාජඵලයක් නොවේ ද?

දෙවනුව, මානව වර්ගයාගේ බිහිවීම සහ එහි පැවැත්ම පිළිබඳ ක්‍රම විකාශනය පිළිබඳ පර්යේෂණාත්මක අවධානය යොමු කළ විද්වතුන් විරල නොවේ. එකී පර්යේෂණ අධ්‍යයනවලින් හෙළිදරව් කෙරුණු බොහෝ නිගමනයන්, මානව අධ්‍යාපන ක්‍රියාවලිය සහ සංස්කෘතිකමය වටපිටාව සමඟ තදින්ම බැඳී ඇති බව පෙනේ. ප්‍රකට විශේෂඥයකු වූ ලුවී එච්. මෝගන්ගේ (Luvi H. Morgan) මානවවිද්‍යාත්මක පර්යේෂණ රාශියක්

ඇසුරෙන් ෆ්‍රෙඩ්රික් එංගල්ස් (Friedrich Engels,1820-1895) විසින් හෙළිදරව් කරන ලද බොහෝ කරුණු ඊට සාක්ෂි සපයයි.

ප්‍රාථමික අවධියේ දී මිනිසා නිවර්තන සහ අර්ධ නිවර්තන වනාන්තරවල අර්ධ වශයෙන් ගස් උඩ ද ඉන්නට ඇත. ඔවුන්ගේ ආහාරය වූයේ පලතුරු වර්ග විය හැකි ය. මේ අවධියේ දී මූලික ප්‍රාථමික සන්නිවේදනයක් වාචික වශයෙන් සිදුවන්නට ඇතැයි එංගල්ස් විශ්වාස කරයි. මධ්‍ය අවධියේ දී පෙරට වඩා තරමක් ගවේෂණශීලී වූ මිනිසා අවිආයුධ නිපදවීමට ද, එමගින් ක්‍රමයෙන් පරිසරය ජයගැනීමට ද පෙළඹෙන්නට ඇතැයි ඔහු අදහස් කරයි. එම අවිආයුධවල කිසියම් ගොරහැඩි රළු බවක් තිබෙන්නට ඇත. ඒ සමගම ගින්දර සොයා ගැනීමත් ඇරඹිනි. දඩයම් සඳහා දුන්න හා ඊතලය නිපදවා ගැනීම, උත්තර අවධියේ දී සිදුවිය. පරිසරය තවත් ජයගත් හෙතෙම පරිසර ජයග්‍රහණය ජීවන පැවැත්ම සඳහා හැඩගස්වා ගත්තේ ය. ඔහු ලත් ජීවන පරිචය, නිපදවීම් රැසකට මුල්විය (මහේන්ද්‍ර 1985 : 11).

උක්ත උපුටනයෙන් කුළුගැන්වෙන සමාජ ක්‍රම විකාශනය මානව වර්ගයාගේ ජීවනය පිළිබඳ කියැවෙන ඓතිහාසික සමාජ ක්‍රියාවලියක් පිළිබඳ ප්‍රවේශීය ගමන් මාර්ගයේ මුල් පියවර ලෙස ද හඳුන්වාදිය හැකි ය. ප්‍රාථමික මිනිස් අවධිය (Savagery), වනචාරි මිනිස් අවධිය (Barbarism) හා ශිෂ්ටාචාරවත් මිනිස් අවධිය (Civilized) යනුවෙන් මානව සමාජ විකාශනයේ ප්‍රධානතම සන්ධිස්ථාන තුනක් දක්වන එංගල්ස්, ඒ ඒ අවධීන්වල සිදු වූ ක්‍රියාකාරකම් හා එහි වර්ධනීය අවස්ථාවන් පැහැදිලි කරයි (Engels, 1876).

මව්වරු සිය ගැහැණු දරුවන්ට ඉවුම්පිහුම් හුරුකරවන අයුරුත්, දරුවන් හදාවඩා ගන්නා අයුරුත් කියාදුන් අතර, පියවරු සිය පිරිමි දරුවන්ට දඩයමේ ගොස් සතුන් මරාගන්නා අයුරුත්, ස්වකීය සාමාජිකයා සතුරු උපද්‍රවයන්ගෙන් තොරව ආරක්ෂා කරගන්නා අයුරුත් ඉගැන්වූ හ. මානව සංස්කෘතියේ මූලිකතම අනන්‍යතාවක් ලෙස ඉගෙනුම් ක්‍රියාවලිය නම් කෙරෙන්නේ ඒ අනුව ය. අද්‍යතන මානව සංස්කෘතිය තුළ ප්‍රකටව පෙනෙන සන්නිවේදනය සහ තොරතුරු තාක්ෂණය සමඟ බැඳුණු නව අධ්‍යාපනික ප්‍රවණතාව (The new educational trend bounded with Communication and Information Technology) ඒ සඳහා වන නූතන සාක්ෂිය යි.

සංස්කෘතිය විශ්ලේෂණයේ දී ප්‍රකට සමාජවිද්‍යාඥ මාග්‍රට් මීඩ් දක්වන ආකාරයට එහි මූලික අධ්‍යාපන අවස්ථා ත්‍රිත්වයක් පෙන්නුම් කරයි. කුඩා දරුවන් සිය මව්පියන්ගෙන්, ගුරුවරුන්ගෙන් හා සමාජයෙන් ඉගෙනීම පශ්චාත් රූපික සංස්කෘතිය යි. සමවයස් කණ්ඩායම්වලින් උගන්නේ සමරූපික සංස්කෘතිය යි. එය වර්තමානය හා සැසඳෙන්නකි. ඉතිහාසයේ වටිනාකම් ඇසුරින් ඉගෙනීම ප්‍රාග්රූපික සංස්කෘතිය යි. මෙකී ක්ෂේත්‍ර ත්‍රිත්වයම සමාජානුයෝජනය හා දැඩි ලෙස බැඳී පවතින්නකි (Mead, 1980). සමාජානුයෝජනය (Socialization) යනු සමාජ උරුමය පාරම්පරිකව පවත්වා ගැනීමකි. එය ද සපුරාම ඍජු හෝ වක්‍ර ඉගෙනුම් ක්‍රියාවලියක් තුළ සිදුකෙරෙන්නක් ලෙස සැලකේ.

සමාජ සම්බන්ධතාවන් හි ජාලීය ලක්ෂණය කැපී පෙනෙනුයේ එහිදී ය. මිනිසා සමාජීය සත්වයකු ලෙස ආරම්භ කළ ජීවිතයේ මූලික අනන්‍යතාව වූයේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව යි. වනගත සත්වයින් ලෙස වෙන්වෙන් වශයෙන් දිවි ගෙවන හුදකලා වූවන් හා විවෘත මිනිස් සමාජය සාපේක්ෂව සසඳා බැලීම මෙහි ලා අත්‍යවශ්‍යය ය. වර්ෂ 1799 දී ප්‍රංශයේ ඇවිරොන් වනාන්තරයෙන් සොයා ගනු ලැබූ 12 හැවිරිදි මිනිස් පැටවකු පිළිබඳ ෂන් මාක් ගුස්පාට් ඉටාර්ඩ් විසින් The Wild Boy of Aveyron නම් කෘතියෙහි පළ කරනු ලබන මේ හෙළිදරව්ව සංවිභාගශීලීව විමසමු. ජාලීය සමාජ සම්බන්ධතාවෙන් තොර හුදෙකලා බව මානව සංස්කෘතියෙහි නිශේධනීයභාවය කියාපාන බව මේ උද්ධෘතයෙන් අවධාරිත ය.

"ඔහුගේ දෑස් සසල වෙමින් පැවතින. යමක් ප්‍රකාශ කර ගත නොහැක්කා සේ ය. එක් වස්තුවක් දෙස දෑස් යොමුකොට තබාගෙන හිඳ වහා තවත් වස්තුවක් කරා යොමුකරයි. යමක් අතපත ගාන හැටි, භාණ්ඩයක් අල්ලන හැටි ඔහුට නුහුරු ය. පින්තූරයක් පෙන් වූ විට එය හඳුනාගත නොහැකිව සිටියි. යම් යම් ශබ්ද වටහාගත නොහැකි ය. සංගීතය විඳ පුරුද්දක් නොමැත. ඔහුගේ කට හඬේ ඇත්තේ සත්වයකුගේ මුවින් පිටවන ගුරුගුරු හඬකි. ඔහුට ගඳ සුවඳ පිළිබඳ විචක්ෂණයක් නොවී ය. අතට දුන් ඕනෑම දෙයක් සතකු මෙන් ඉව අල්ලා බලන බවක් පෙනින. සීතල කාලයේ දී වුව ගණ රෙදි කඩකින් තොරව බොහෝ වේලා බිම වැතිරගෙන සිටිය හැකි ශක්තියක් ඔහු තුළ තිබිණ. ඔහු එහාට මෙහාට ඇවිදින්නේ මානවයකු මෙන් නොව, තිරිසන් සතකු මෙනි" (මහේන්ද්‍ර, 1993).

ඔහු මිනිසකු වුව තිරිසනකු ලෙස පිළිබිඹු වූයේ පුළුල් සමාජ සම්බන්ධතාවයෙන් වියුක්ත හුදකලා බව නිසාම මානව සංස්කෘතියෙහි මුල් සිඳගත් බැවිනි. සමාජ සංස්කෘතියෙහි ස්වභාවිකත්ව විශ්ලේෂණයේ දී විද්වතුන් හඳුන්වාදෙන ප්‍රමුඛ ලක්ෂණ ත්‍රිත්වයක් පිළිබඳ මෙහි සටහන් කිරීම බෙහෙවින් යෝග්‍යතර ය. නවීකරණය (Modernization) විසරණය (Diffusion) සහ සමාවනය හෙවත් රාශිකෘත්‍ය (Accumulation) යනුවෙන් පැහැදිලි කරනුයේ එකී සංලක්ෂණයන් ය.

මෙහි නවීකරණය යන ප්‍රමුඛ විචල්‍යතාව මානව සංස්කෘතික විකාශනයෙහි ප්‍රබලතම නිර්ණායකයක් ලෙස ගැනේ. නවීකරණය යන්න ද්විත්වාර්ථ සහිත නාමකරණයකි. ධනාත්මක මෙන්ම ඍණාත්මක අරුත් සම්පාදනයක් එයින් පිළිබිඹු කෙරෙන බව ඉන් කියැවේ. ඊට අදාළ අරමුණු, ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ගයනට අනුව එහි ප්‍රතිඵල ඉෂ්ට හෝ අනිෂ්ට විය හැකි බැවිනි. එබැවින්, ඒ සඳහා නිශ්චිත අර්ථ විග්‍රහයක් අත්‍යවශ්‍ය ය. ඒ අනුව, "නවීකරණය යනු යහපත් වර්ධනයක් උදෙසා අදාළ කොටගත හැකි යහපත් වෙනස්වීමක්" ලෙස එය අර්ථ ගැන්වෙයි.

යට කී උපුටනය තුළ සඳහන් කෙරුණු තිරිසන් පැටවා ද එකී නවීකරණ විෂය පථයෙන් මිදුණු, සමාජ සම්බන්ධතාවලින් ගිලිහුණු එකෙකි. සමාජ සංවර්ධන හා සංස්කෘතික ප්‍රවර්ධන ක්‍රියාවලියේ දී පුද්ගල සම්බන්ධතාව අත්‍යවශ්‍ය සාධකයක් බව අවධාරණය කරනුයේ එබැවිනි (Itard,1962).

සමාජ අන්තර්ක්‍රියාවන් ද (Social Interactions) ඊටම සාපේක්ෂ ය. අන්තර්ක්‍රියාවන් නිර්මාණය කෙරෙනුයේ සම්බන්ධතා කරණකොටගෙන ය. ඒ අනුව, අන්තර්ක්‍රියා යනු සමාජ චර්යාවන් හෙවත් හැසිරීම් රටාවල් ලෙස සමහරු හඳුන්වති. සංස්කෘතිය යන්නෙන් හඳුන්වන්නේ ද එයමැ යි (The term culture names human behavior that is learned rather than biological transmitted) තවත් මතයකි. ඇස්, කන්, නාසා, දිව, සම ඇතුළත් පංචේන්ද්‍රියයන් සහිත සකලවිධ මානවයෝ ඒ හා බැඳෙති. දීර්ඝකාලීන අඛණ්ඩත්වය, ඓතිහාසික ඉගෙනුම් ක්‍රියාවලිය, පුළුල් සමාජ සම්බන්ධතා ජාලය හා සමාජ අන්තර්ක්‍රියා හරය ආදී ප්‍රමුඛ ලක්ෂණයන් සංස්කෘතියෙහි ලා කුළුගැන්වෙනුයේ ඒ අනුව ය.

මාධ්‍ය සංස්කෘතිය එහි එක් ආනුෂාංගික ක්ෂේත්‍රයකි. දේශපාලන සංස්කෘතිය, අධ්‍යාපන සංස්කෘතිය සහ ආගමික සංස්කෘතිය ආදී වශයෙන් වූ තවත් විවිධාකාර ප්‍රවේශයන් මෙහි දී හඳුනාගත හැකි ය. ඒ ඒ විෂය පරිශ්‍රයන්ට

අනන්‍ය ව්‍යුහාත්මක අභ්‍යන්තර ලක්‍ෂණ අනුව ඒවා වර්ග කෙරේ. ඒ අනුව, මාධ්‍ය සංස්කෘතිය යනු එකී විෂයයෙහි ලා අනන්‍යතා ලක්‍ෂණ ප්‍රකට කෙරෙන්නා වූ ත්, ඒ හා සම්බන්ධිත ව්‍යුහාත්මක හා අභ්‍යන්තර ස්වරූපතා පිළිබිඹු කරන්නාවූ ත් සමාජමය හැඟීම්, සිද්ධි, වස්තු හා ක්‍රියාකාරීත්ව සමුදායකි. එය සජීවී සමාජ ක්‍රියාවලියකි. ඒ අනුව, මාධ්‍යසංස්කෘතිය යනු නිශ්චිත සමාජ කොට්ඨාසයක් තුළ හෝ නිශ්චිත භූගෝලීය කලාපයක් තුළ අදාළ මාධ්‍ය ක්‍රියාවලිය පසුබිම් කොටගෙන නිර්මාණය කෙරෙන සංස්කෘතිකමය රටාව යි.

සමාජ සංවර්ධනයෙහි ලා එහි ඥාතීත්වය විමසීමේ දී මාධ්‍ය හා සංස්කෘතිය අතර පවත්නා නිශ්චිත චිරකාලීන සම්බන්ධතාව වඩාත් වැදගත් වෙයි. මන්ද යත්, ප්‍රාකෘතික යුගයේ පහළම අවධියේ සිට (from the Lover Stage of Savagery) අද දක්වා වූ මානවවංශික මාධ්‍ය ක්‍රියාවලිය මානව සංස්කෘතිය හා අත්‍යන්තයෙන් බැඳී බද්ධ වී පවතින බැවිනි. මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ පුළුල් පර්යේෂණාත්මක ප්‍රතිෂ්ඨාවක් සහිතව ගැඹුරින් විමංසනය කිරීමේදී හඳුනාගත හැකි සුවිශේෂතා දහයකි. එනම්,

1. මාධ්‍ය වූ කලී සංස්කෘතියෙහි නිර්මිතයකි.
2. සංස්කෘතිය දරා සිටීමෙහිලා ද ගබඩා කිරීමෙහිලා ද මාධ්‍ය උපකාරී වේ.
3. සංස්කෘතික ප්‍රවර්ධනය සඳහා මාධ්‍ය උපස්ථම්භක කොට ගැනේ.
4. නව සංස්කෘතික රටා ප්‍රචලිත කෙරෙනුයේ මාධ්‍ය මඟිනි.
5. සංස්කෘතික ප්‍රවාහනය මාධ්‍ය මඟින් සිදුකෙරේ.
6. මාධ්‍ය වූ කලී සංස්කෘතිය සම්බන්ධ පෙළැඹවීම් කාරකයකි.
7. අන්තර් සංස්කෘතික සබඳතා කෙරෙහි සුවිශේෂ මධ්‍යස්ථානයකි.
8. ජනප්‍රිය සංස්කෘතියෙහි ප්‍රමුඛතම ප්‍රචාරකයා ය.
9. සංස්කෘතික අධ්‍යයනයෙහි පුරෝගාමී ප්‍රවේශයයි.
10. මානවවංශික සංස්කෘතික ක්‍රමවිකාශනයෙහි සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් නූතනය හා බැඳුණු අග්‍රගණ්‍ය සංකේතය යි.

මාධ්‍ය හා සංස්කෘතිය අතර පවත්නා අවියෝජනීය සම්බන්ධතාව ඒ අයුරින් හෙළිදරව් කිරීමේ දී කුළුගැන්වෙන කාරණය වන්නේ එකී විෂය පාර්ශවයන් විසින් සමාජ ප්‍රගමනයෙහි ලා ඉටුකළ හැකි කාර්යභාරය සුවිශාල බව යි. ඒ අනුව, මාධ්‍ය හා සංස්කෘතිය යනු දෙකක් නොව, එකක් ලෙස ගිනිය හැකි ය.

මන්දයත්, ඒ දෙපාර්ශවය කෙරෙහි ම අනන්‍යකොට ගැනුණු පොදු ලක්ෂණ කරණකොටගත් සමරූපී ස්වභාව රාශියක් නිසාවෙනි. සංස්කෘතිය ත්, මාධ්‍යයත් වෙන්වෙන් වශයෙන් ගෙන සලකා බැලූව ද, එකක් ලෙස ගෙන සලකා බැලූව ද මේවා සමාජ ප්‍රගමනකාරී සංලක්ෂණ ලෙස තවදුරටත් අධ්‍යයනය තුළින් පිලිබිඹු වෙයි. එකී පොදු සාධක මෙසේ පෙළගැස්විය හැකිය.

1. පරිසරය හා ඓතිහාසික චර්‍යාකම් ඇසුරින් ප්‍රභවය වේ.
2. විශිෂ්ට සමාජ ආරක්ෂකයෙකි. සංවිධායකයෙකි. මාර්ගෝපදේශකයෙකි.
3. කිසියම් ආකෘතියක් හෝ ව්‍යුහාත්මක ස්වරූපයක් දරා සිටියි.
4. වර්ගීකරණය කළ හැකි අතර සාමාජිකයින් අතර බෙදී යයි.
5. ගතික ය. එකතැන පල් නොවේ. කාලානුරූපව වැඩී එයි.
6. පෞද්ගලික හා පොදු ක්‍රියාකාරකම් කෙරෙහි ලා ප්‍රචාරකයෙකි.
7. විද්‍යාත්මක ලෙස විශ්ලේෂණයට භාජන කළ හැකිය.
8. හැසිරීම් රටා තීරණය කළ හැකි සමාජ පාලන උපකරණයකි.
9. අත්‍යවශ්‍ය දැනුම් හා චර්‍යාකම්වල කෞතුකාගාරයකි.
10. පුද්ගල පෞරුෂයට බලපෑම් කළ හැකි උත්තේජන කාරකයකි.

යථෝක්ත සංලක්ෂණ, ධනාත්මක පිළිගැනුම් (Positive Acceptance) ලෙස සලකාබැලීම සමාජ ප්‍රවර්ධනයෙහි ලා බෙහෙවින් අදාළ ය. එයින් කියැවෙන්නේ, අවශ්‍ය නම් ඒවා ඍණාත්මක හෝ නිශේධනාත්මක ප්‍රතික්ෂේපයක් (Negative - Rejection) ලෙස ද සලකා බැලිය හැකි බව ය. වර්ධනය, ප්‍රවර්ධනය, සහ සංවර්ධනය යනු සමානරූපී අර්ථ දක්වන වචන මාත්‍රයක් ලෙස සරලව සලකා බැලිය හැකි ය. සමාජයේ සකලවිධ ක්ෂේත්‍රයන් තුළ පෙන්නුම් කෙරෙන යහපත් වෘද්ධිමය ස්වභාවය එයින් අදහස් කෙරේ. සමාජවිද්‍යාත්මක අර්ථවිග්‍රහයට අනුව (According to the Sociological Interpretation) හුදු මූල්‍යමය තක්සේරුවකට හෝ භෞතිකමය චර්‍යාකමකට හෝ සීමා නොවුණු ප්‍රගතිය මෙමඟින් අර්ථ ගැන්වෙන බව ඒ සඳහා වූ පොදු පිළිගැනීම යි.

ඒ අනුව, "පොදු මිනිසා හා පරිසරය ඇතුළු සමස්තය තුළ සිදුකෙරෙන යහපත් වෙනස" එයින් අවධාරණය කෙරේ (නානායක්කාර, 2012). මානවයා ඇතුළු සකලවිධ ජීවීන්ට සම්බන්ධ බාහිර හා අභ්‍යන්තරික මෙන්ම, භෞතික

හා ආධ්‍යාත්මික සියලු සාධකයන්, එනම්, ද්‍රව්‍යමය හා චින්තනමය ආදී සියලු ස්වභාවයන් මීට අදාළ කොට ගැනේ. ඒ අනුව, මෙම සංක්ෂිප්ත නිබන්ධයෙහි ලා කේන්ද්‍ර කොටගැනුණු මාධ්‍ය සංස්කෘතිය, උක්ත සමාජ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් දක්වන සමාජ විද්‍යාත්මක ඥතීත්වය (Sociological Relationship) සමාජ ධර්මතාවක් (Social Norm) තරමටම නිශ්චිත ය. එනම් මාධ්‍යසංස්කෘතිය හා සමාජය යනු ක්‍රියාවලියක් හා පසුබිමකි (Act and Background). එසේනම්, මාධ්‍ය සංස්කෘතිය යනු උක්ත සමාජ ප්‍රගමනය සඳහා වන අවියෝජනීය වූ, දැඩි සේ බැඳුණු ක්‍රියාකාරීත්ව ස්වභාවයක් ලෙස පිළිගත යුතුව ඇත.

පූර්වෝක්ත දස වැදැරුම් හඳුනාගැනීම් මාධ්‍ය සංස්කෘතිය සම්බන්ධයෙන් වන මූලික ඉඟි දැක්වීමක් පමණි. සුප්‍රකට සමාජ විද්‍යාඥයකු වූ එමිල් ඩූර්කයිම්ගේ (Emile Durkheim, 1858-1917) එක් ප්‍රකාශයකට අනුව නම්, මේ සියල්ලම විවිධ අංගයන්ගේ එකමුතුවක් වූ සාමූහික නියෝජනයක් ලෙස (Collective Representation) හඳුන්වාදිය හැකි ය.

එපමණක් නොවේ, මාධ්‍ය සංස්කෘතිය සහ සමාජ ප්‍රගමනය යන පාර්ශවද්වයටම පොදු වූ භෞතික හා අභෞතික ස්වභාවයන් (Nature of Physical and Spiritual) මෙහිදී අමතක කළ යුතු නොවේ. භෞතික ස්වරූපය තුළ කුළුගැන්වෙන ප්‍රකට, විවෘත, මූර්ත, සංකේතික, බාහිර සහ ප්‍රමාණාත්මක ආදී ආස්ථානයන්, අභෞතික ස්වරූපය තුළ දී, අප්‍රකට, ආවෘත, අමූර්ත, අසංකේතී, අභ්‍යන්තර හා ගුණාත්මක ආදී ආස්ථානයන් බවට පරිවර්තනය වෙයි. ඒ එකිනෙකෙහි සමාජ බලපෑම ද (Social Impact) සුවිශේෂ ය. මාධ්‍ය සංස්කෘතිය හා සමාජ ප්‍රවර්ධනය යන්න ක්‍රියාවලි ද්විත්වයක් ලෙස ගත් කල, එහි සමාජවිද්‍යාත්මක ඥතීත්වය අතිශය සමීප බව ඉන් අවධාරිත ය.

## නිගමනය

මාධ්‍ය සංස්කෘතිය යනු, මහා සමාජ සංස්කෘතිය තුළින් නිෂ්පන්න ආනුෂාංගිකයකි. එය මාධ්‍ය හා සමාජය යන පාර්ශවද්වයයෙහි ක්‍රියාකාරීත්වය කරණකොටගෙන නිර්මිත ස්වභාවයන්ගේ සංකීර්ණ සමස්තයකි. එමෙන්ම, සමාජ ප්‍රගමනයෙහි ලා මෙන්ම අවගමනයෙහිලා ද බලපෑම් කළ හැකි ඍජු හා වක්‍ර ශක්‍යතාවන් මාධ්‍ය සංස්කෘතියෙහි ලා අනන්‍ය වෙයි. එයින් ප්‍රකට කෙරෙන

ධනාත්මක හෝ ඍණාත්මක සංදේශයන් සම්බන්ධයෙන් පොදුජන සමාජය දක්වන ප්‍රතිචාර අනුව, එහි බලපෑම ඉෂ්ට හෝ අනිෂ්ට විය හැකිය. සමාජ ප්‍රවර්ධනය හෝ පරිහානිය සලකා බැලිය හැක්කේ එහි දිගුකාලීන තක්සේරුවක් තුළින් පමණි. එබැවින්, යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම වූ කලී, යහපත් සමාජයක් සඳහා වූ සුවිසල් සමාජ ක්‍රියාවලියක පදනම් ප්‍රතිෂ්ඨාපනයක් ලෙස අරුත් ගැන්විය හැකිය. ඒ අනුව, මාධ්‍යසංස්කෘතිය යනු, සමාජ ප්‍රගමනයෙහි ලා වඩාත් සමීපතා පිළිබිඹු කරන, තීරණාත්මක සාධකයකැයි යන්න මෙයින් අවධාරණය කෙරේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

Engels, Friedrich, (1876). *The origin of the family: private property and the state.* Moscow, Progress publishers.

Itard, Gaspard, (1962). *The wild boy of aveyron.* Translated by George and Marcel Humphrey, Englewood Cliffs, New Jersey, Prentice Hall.

Linton, Ralph, (1957). *The tree of culture.* New York, A. A. Knopf publication.
Mead, Margret, (1967). Culture and surviwel of the society, communication and human being *Sociological view.* (ed) Martin Muler, New York, Colombia University Press.

Tylor, E. B., (1920). *Primitive culture.* New York: J.P. Putnam's Sons.

නානායක්කාර, සේන, (2012). *සංවර්ධනාත්මක සන්නිවේදනය.* කොළඹ, එස්. ගොඩගේ සහෝදරයෝ.

මහේන්ද්‍ර, සුනන්ද, (1985). *ජනමාධ්‍යයේ නැගීම.* රාජගිරිය, සුසිත ඉන්ඩස්ට්‍රියල් ප්‍රින්ටර්ස්.

මහේන්ද්‍ර, සුනන්ද, (1993). *සන්නිවේදන විචාර ප්‍රතිචාර.* කොළඹ, එස්. ගොඩගේ සහෝදරයෝ.